සැ. යු. - 2024.07.26 දින පළ වූ අංක 2395 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,396 - 2024 අගෝස්තු මස 02 වැනි සිකුරාදා - 2024.08.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 630 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 633 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අගෝස්තු මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් කරන ලද නිවේදනයයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම**

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව, මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2(2), 2(4) උපවගන්ති අනුව පහත අංක 1 වැනි තීරුවේ නම සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) වෙත III වැනි තීරුවේ සඳහන් බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ඒ. පී. ජී. එස්. අමරතුංග මිය | 2023.11.23 | මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් අංක 3, 5, 6, 7, 8, 9, 33, 43, 43අ, 44, 45, 46, 48, 52, 53, 54, 58, (2අ, 3,4,5 උපවගන්ති හැර) 59, 60අ, 66, 67, 68, 69 74, 75 සහ 1973 සමුපකාර සමිති රීති මාලාවේ අංක 4, 11, 15, 16 (ii), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (12 ආ, ඇ, ඈ, ඉ උපවගන්ති හැර) 51, 52, 53 යන රීති යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු බලතල. |

නීතිඥ ලලිත් යූ. ගමගේ,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

08-05

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත

1983 අංක 32 සහ 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත් සමඟ කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 57 (2) වගන්තිය යටතේ සමුපකාර සමිති ඈවරකර අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ලියාපදිංචිය අවලංගු කර ඈවර කටයුතු අවසන් කරන ලද බව 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 57 (2) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

එන්. මදිවන්නන්,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,
නැගෙනහිර පළාත.

2024 ජූලි මස 13 වැනි දින.

| *අනු. අංකය* | *ලියාපදිංචි අංකය* | *සමිතියේ නම* | *ලියාපදිංචිය අවලංගු කරන ලද දිනය* | *ස. ස. සහ කො. කොට්ඨාසය* |
|---|---|---|---|---|
| 1 | ED 570 | සීමාසහිත ගල්ඔය වැලි 04 විවිධ සේවා සමුපකාර සමිතිය | 1971.06.24 | කල්මුණේ |
| 2 | BT 206 | සීමා රහිත නොච්චිමුනෙයි කලෙයිමගල් සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය. | 2018.10.22 | මඩකලපුව |

| අනු. අංකය | ලියාපදිංචි අංකය | සමිතියේ නම | ලියාපදිංචිය අවලංගු කරන ලද දිනය | ස. ස. සහ කො. කොට්ඨාසය |
|---|---|---|---|---|
| 3 | ED 426 | සීමා රහිත පනිච්චන්කේනි හරික්‍රිෂ්ණා සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමූපකාර සමිතිය | 2017.01.31 | මඩකලපුව |
| 4 | ED 164 | සීමා සහිත එරාවූර් පත්තු විවිධ සේවා සමූපකාර සමිතිය. | 2021.12.29 | මඩකලපුව |
| 5 | ED 623 | සීමා සහිත ඉරක්කාමම් විවිධ සේවා සමූපකාර සමිතිය | 1971.06.24 | මඩකලපුව |
| 6 | ED 742 | සීමා සහිත ඊච්චන්තීව් විවිධ සේවා සමූපකාර සමිතිය | 2010.03.03 | මඩකලපුව |
| 7 | KM 49 | සීමා සහිත අක්කරෙයිපත්තු අංක 06 විවිධ සේවා සමූපකාර සමිතිය | 1971.03.14 | කල්මුණේ |
| 8 | GV 13 | සීමා සහිත කරුවාඩ්ඩුකල් විවිධ සේවා සමූපකාර සමිතිය. | 1963.08.21 | කල්මුණේ |
| 9 | KM 26 | සීමා සහිත අක්කරෙයිපත්තු අංක 01 දකුණ විවිධ සේවා සමූපකාර සමිතිය | 1971.03.14 | කල්මුණේ |
| 10 | ED 527 | සීමා සහිත ගල්ඔය වැලි 11 විවිධ සේවා සමූපකාර සමිතිය. | 1971.06.24 | කල්මුණේ |
| 11 | ED 780 | සීමා සහිත කෝලාවිල් ශ්‍රී මුරුගන් විවිධ සේවා සමූපකාර සමිතිය | 1971.03.14 | කල්මුණේ |
| 12 | KM 80 | සීමා සහිත පොතුවිල් අංක 01 උතුර නාගූර් කාදර් මීරා දකුණ විවිධ සේවා සමූපකාර සමිතිය | 1971.03.31 | කල්මුණේ |
| 13 | ED 569 | සීමා සහිත ගල්ඔය වැලි 06 විවිධ සේවා සමූපකාර සමිතිය | 1971.03.24 | කල්මුණේ |
| 14 | BT 230 | සීමා සහිත එරුවිල් කෙටි ආහාර නිෂ්පාදන සමූපකාර සමිතිය | 2016.11.04 | මඩකලපුව |
| 15 | BT 358 | සීමා සහිත කෝඩයිකල්ලාරු කෙටි ආහාර නිෂ්පාදන සමූපකාර සමිතිය | 2016.11.04 | මඩකලපුව |
| 16 | Tri 364 | සීමා සහිත ත්‍රිකුණාමලය කම්කරු සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 17 | Tri 375 | සීමා රහිත සල්ලි වික්නේෂ්වරා ධීවර සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 18 | Tri 376 | සීමා සහිත ඉලියාර් අභිවෘද්ධි සංවර්ධන සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 19 | Tri 377 | සීමා සහිත එක්සත් කම්කරු සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 20 | Tri 378 | සීමා සහිත තරුණ සංවර්ධන සමිතිය | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 21 | Tri 441 | සීමා සහිත ත්‍රිකුණාමලය ඇගළුම් නිෂ්පාදන සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 22 | Tri 452 | සීමා සහිත පුම්පුකර් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 23 | Tri 453 | සීමා සහිත පාලයුත්තු කෝවිල්අඩි සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය. | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 24 | Tri 470 | සීමා සහිත ජින්නානගසර් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 25 | Tri 476 | සීමා සහිත ත්‍රිකුණාමලය මාරවේලයි සමූපකාර සමිතිය | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 26 | Tri 509 | සීමා සහිත කුච්චවේලි ප්‍රදේශ පොල් හා තල් නිෂ්පාදන සමූපකාර සමිතිය | 2020.12.21 | ත්‍රිකුණාමලය |
| 27 | ED 568 | සීමා සහිත ගල්ඔය වැලි 07 විවිධ සේවා සමූපකාර සමිතිය. | 1971.06.24 | කල්මුණේ |
| 28 | අම්/117 | සීමාරහිත අම්පාර ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිළධාරින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 29 | අම්/141 | සීමාරහිත පහලලන්ද සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |

| අනු. අංකය | ලියාපදිංචි අංකය | සමිතියේ නම | ලියාපදිංචිය අවලංගු කරන ලද දිනය | ස. ස. සහ කො. කොට්ඨාසය |
|---|---|---|---|---|
| 30 | අම්/57 | සීමාරහිත අම්පාර දිස්ත්‍රික් සමුපකාර නිළධාරින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සිමිතිය | 2023.06.05 | අම්පාර |
| 31 | අම්/175 | සීමා රහිත කම්හල් පෙදෙස සුමග සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 32 | අම්/104 | සීමාරහිත විජයපුර එක්සත් සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 33 | අම්/140 | සීමාරහිත නවගිරියාව තිළිණ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 34 | අම්/158 | සීමාරහිත තොට්ටම පැරණිගම සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 35 | අම්/166 | සීමාරහිත 110 පොල්වත්ත ගැමුණු සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 36 | අම්/129 | සීමාරහිත කෙහෙල්උල්ල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 37 | අම්/167 | සීමාරහිත හෙලගම්පුර සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 38 | අම්/146 | සීමාරහිත උහන සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 39 | අම්/130 | සීමාරහිත හිමිදුරාව වම් ඉවුර සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 40 | අම්/134 | සීමාරහිත හිමිදුරාව එකමුතු සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 41 | අම්/176 | සීමාරහිත මාහාදුන්න සරණ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 42 | අම්/132 | සීමාරහිත කරංගාව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 43 | අම්/154 | සීමාරහිත නාමල්තලාව 2 බී සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 44 | අම්/112 | සීමාරහිත අඹගහවැල්ල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2023.06.05 | අම්පාර |
| 45 | Bat/213 | සීමාසහිත මඩකලපුව පට්ටන සුහසාධක සමුපකාර සමිතිය | 2016.11.04 | මඩකලපුව |
| 46 | Bat/508 | සීමාසහිත කොතියාපුල උහ උනව උම්පත්තියාල සමුපකාර සමිතිය | 2016.09.06 | මඩකලපුව |

08-14

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024*

2024.06.14 දින පළ වූ *ගැසට් පත්‍ර* අංක 2389 හා නිවේදන අංක 06-85 පහත පරිදි සංශෝධනය කෙරේ.

| | |
|---|---|
| 3 (V) | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධරයන් හට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.) |
| 7.2 | අයදුම්පත් භාරගන්නා අවසන් දිනය - **2024.08.16** |
| 7.3 | මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත **2024.08.26** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් එවිය යුතු ය.<br><br>ලේකම්,<br>වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>කුරුණෑගල.<br><br>අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024'' ලෙස සඳහන් කළ යුතු ය. |

ඊ. එම්. පී. ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

08-39

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 2024 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **අගෝස්තු** | 2024.08.02 | සිකුරාදා | 2024.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.09 | සිකුරාදා | 2024.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.16 | සිකුරාදා | 2024.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.23 | සිකුරාදා | 2024.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.30 | සිකුරාදා | 2024.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2024.09.06 | සිකුරාදා | 2024.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.13 | සිකුරාදා | 2024.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.20 | සිකුරාදා | 2024.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.27 | සිකුරාදා | 2024.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2024.10.04 | සිකුරාදා | 2024.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.11 | සිකුරාදා | 2024.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.18 | සිකුරාදා | 2024.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.25 | සිකුරාදා | 2024.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.